## තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මුක්ත කර ඇති තොරතුරු ලෙස වෙබ් අඩවියෙහි පල කිරීම සඳහා අංශ විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පහත පරිදි වේ.

- නිලධාරීන්ගේ අනන්‍යතාවය තහවුරු කෙරෙන තොරතුරු (ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය වැනි) සහ පෞද්ගලික තෙරෙතුරු
- බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු
- වැටුප් පිළිබඳ විස්තර
- වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳ විස්තර
- නීතිපතිවරයා හෝ ඔහුගේ නිලධාරීන් හෝ වෘත්තිකයන් විසින් පොදු අධිකාරියක් අතර සන්නිවේදනය වූ තොරතුරු
- අපරාධ වැලැක්වීම, වරදකරුවන් අල්ලා ගැනීම හෝ නඩු පැවරීමට අගතියක් වන තොරතුරු
- තෙවන පාර්ශවයක් රහසිගතව සපයා ඇති හා හෙළිදරව් කිරීමට එම පාර්ශවය අනුමැතිය ලබා දී නොමැති තොරතුරු
- අධිකරණයට අපහාස වන හෝ අධිකරණ බලයට බලපෑමක් වන තොරතුරු
- පාර්ලිමේන්තු හෝ පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන තොරතුරු
- තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශ තොරතුරු
- මැතිවරණ නීති මඟින් රහසිගතව තැබිය යුතු යැයි නියමිත තොරතුරු
- අමාත්‍ය මණ්ඩලය මඟින් තීරණයක් ලබා නොදුන් අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාල තොරතුරු
- පළාත් සභා ධූරධාරීන්ට පුද්ගලික වන සේ සහනදායි පදනම මත ලබා දෙන වාහන ආනයන බලපත්‍ර සම්බන්ධයෙන් වන තොරතුරු (බාහිර පුද්ගලයන් වෙත)
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ විශ්‍රාමික නිලධාරීන්ට ලබා දෙනු ලබන සහනදායි වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ කරනු ලබන අයදුම්පත්වලට අදාළ තොරතුරු (බාහිර පුද්ගලයන් වෙත)
- යම් පුද්ගලයෙක් හෝ විෂයයක් හෝ කරුණක් සම්බන්ධයෙන් රහස්‍යභාවයෙන් යුක්තව නිරීක්ෂණ තත්ත්වයේ හෝ විමර්ශන තත්ත්වයේ පවතින තොරතුරු
- පළාත් සභා විෂය හා සම්බන්ධව සිදු කරනු ලබන අභ්‍යන්තර සාකච්ඡා සටහන් හා අභ්‍යන්තර කමිටු තීරණ
- ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව විරෝධතා පරීක්ෂණ වාර්තා හා ඒ සම්බන්ධයෙන් වන තොරතුරු

- සේවා ව්‍යවස්ථා හෝ බඳවා ගැනීමේ පටිපාටි සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති අවස්ථාවලදී ඒ හා අදාලව පළාත් සභා විසින් ලබා දී ඇති නිරීක්ෂණ හා නිගමනවලට අදාළ තොරතුරු
- යම්කිසි ප්‍රසම්පාදනයකට අදාළව තාක්ෂණික ඇගයුම් කටයුතු සිදු කරන අවස්ථාවක දී ඒ පිළිබඳ තොරතුරු
- කිසියම් ලංසුකරුවකු විසින් තවත් ලංසුකරුවෙකු ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලා සිටින විටදී එම තොරතුරු
- අවසන් තීරණයකට එලඹී නොමැති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්වලට අදාළ සම්මුඛ පරීක්ෂණයන්හි තොරතුරු
- නිලධාරීන්ට සහනදායී පදනම මත ලබාදෙන වාහන ආනයන බලපත්‍ර සම්බන්ධයෙන් මත තොරතුරු
- කසල කළමනාකරණය විධිමත් කිරීම සඳහා ලබා දෙන යන්ත්‍ර සූත්‍රවල හා එහි කොටස්වල ක්‍රියාකාරීත්වයට අදාල රහස්‍යභාවය රැකිය යුතු තොරතුරු
- වෙනත් ආයතන හෝ පුද්ගලයන් විසින් අප වෙත ලබාදෙන විශේෂ වර්තාවන් අදාල පාර්ශවයේ අවසරයකින් තොරව ලබාදිය නොහැක (JICA/KOICA)
- අපද්‍රව්‍ය ප්‍රතිකාරකවල සංයුතිය සම්බන්ධ තොරතුරු